මන්මුනෙයි ප්‍රාදේශිය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 15 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1990 දී සිදුවූ යුදමය වාතාවරණය හේතුවෙන් විනාශයට පත්වූ රු. 165,000 ක් වටිනා වත්කම් පොත්වලින් කපාහැරීමට කටයුතු නොකිරීම නිසා ගිණුම් ප්‍රකාශනවල වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබුණු කාර්යාල වාහන 03 ක වටිනාකම් තත්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 17,184 ක ගබඩා තොග ප්‍රයෝජනයට ගත නොහැකි ඒවා වශයෙන් වෙන්කර තිබුණද ඒවා දිගටම වත්කම් වශයෙන් පෙන්වා තිබුණි.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේ සිට විදුලි පාරිභෝගයන්ගෙන් අයවියයුතු රු. 781,370 ක මුදල අයකර ගැනීම සඳහා 2015 ජුනි 10 දින දක්වා කටයුතුකර නොතිබුණි.

(ආ) 1987 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවියයුතුව තිබූ රු. 1,958,631 ක මුදල ගෙවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතු වටිනාකම් රු. 30,883,751 ක්වූ ඉඩම් ගොඩනැගිලි, යන්ත්‍ර යන්ත්‍රෝපකරණ යනාදිය සම්බන්ධයෙන් සථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

1.3.6 නීති, රීති හා රෙගුලාසි කළමණාකරන තීරණ සනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂනය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් හා ගබඩා ද්‍රව්‍ය යනාදී කටයුතු නිලධාරින් තුන් දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදී ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 4,371,982 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,632,844 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 260,862 ක පිරිහිමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලන

---------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

-----------------------------------

(අ) සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම්

-------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීමට නොහැකිවීමේ හේතුවෙන් සහා බලප්‍රදේශයේ පුද්ගලික සන්නිවේදන ආයතනවලින් ස්ථාපිත කර තිබූ සන්නිවේදක කුළුනු තුනක් සඳහා ස්ථාපිත ගාස්තු අයකර ගැනීමට නොහැකි බැවින් සභාව වාර්ෂිකව රු. 150,000 ක් පමණ ආදායමකට බලපා තිබුණි.

(ආ) වරිපනම් බදු

--------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශි සභා බලප්‍රදේශක පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා 2014 වර්ෂ කාලපරිච්ඡේදයේදී වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීම සඳහා විගණන දිනය වන 2015 ජුනි 10 දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු පොළ වෙළඳ සංකීර්ණයේ තිබෙන කඩ කාමර බදු ගත් අයගෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවියයුතු රු. 50,250 ක බදු කුලිය ලබා ගැනීම සඳහා 2015 ජුනි 10 දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධන අරමුදල් පනත සහ 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත අනුව සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථ සාධාක අරමුදලේ දායක මුදල වන රු. 186,018 ක මුදල් සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල වන රු. 26,484 ක් එම අරමුදල් වලට ගැවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1975 වර්ෂයේ පළාත් පාලන විශ්‍රාම වැටුප් රීති සහ 1978 ජුනි 07 වන දින අංක 320/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශිය සභාවේ සේවකයින් නව දෙනෙකුගෙන් අයකරන ලද විශ්‍රාම වැටුප් දායක මුදල එම සේවකයන් වෙනුවෙන් සභාව විසින් ගෙවියයුතු දායන මුදල් ඇතුළුව එකතුව රු. 732,927 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුවට ගැවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අනෙකුත් අමාත්‍යංශ, දෙපාර්තුමෙන්තු සහ ආයතනවලින් සභාවට ලබාදුන් මෝටර් වාහන 05 ක අයිතිය සභාවේ නමට මාරු කිරීම සඳහා වෂ් 06 ක සිට කටයුතු කර නොතිබුණි.

3.2 ප්‍රයෝජනයට නොගත් වත්කම්

-----------------------------------

USAID ආයතනය විසින් 2012 වර්ෂයේදී පරිත්‍යාගයක් වශයෙන් ලබාදෙන ලද රු. 500,000 පමණක් වටිනා කාය වඩින උපකරණ අදාල අරමුණු සඳහා ප්‍රයෝජනයට නොගෙන 2015 ජූනි 10 දක්වා කාර්යාලයේ නිෂ්ක්‍රියව තිබුණි.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය